**ශීර්ෂය 401 ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුලි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන**,** වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂය අවසානයට අමාත්‍යාංශය සතුව වාහන 03ක් පැවති අතර 2021/12/31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ (ඒසීඒ-පී ආකෘතිය) සහ දේපළ පිරියත හා උපකරණ පිළිබඳ විස්තරාත්මක සටහනෙහි (සීඒසී-6) එම වාහනවල වටිනාකම ඇතුලත්ව නොතිබුණි. | අමාත්‍යාංශය සඳහා දැනට අයත්ව ඇති වාහන අදාල ආයතනවලින් අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කල යුතුය |

### 1.6.2 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
| --- | --- | --- |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රැස් කරන ලද රු.48,410,693 ක ආදායම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි ආදායම් නොවන ලැබීම් යටතේ වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් ලෙස ඇතුලත් කර තිබීමෙන් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි ආදායම් නොවන ලැබීම් රු.48,410,693ක් වැඩියෙන් හා අග්‍රිම ශේෂය රු.48,410,693ක් අඩුවෙන් දැක්වුණි. | එකඟ වෙමි. ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරමි. | එම ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට හා අක්මුදල් ගැලපුම් ගිණුමට ගැලපිය යුතුය. |

### 1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම | දැනට අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයන් සමාලෝචනයක් සිදු කර නොමැති අතර ඉදිරියේදි පද්ධතිය ඵලදායි ලෙස සකස් කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමෙන් අනතුරුව එහි පිටපතක් විගණනයට ඉදිරිපත් කරනු ලබන බවට දන්වා සිටිමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, විගණන විමසුම් 7කට පිළිතුරු ලබා දී නොතිබුණි. | විගණන විමසුම් සඳහා පිලිතුරු සකස් කල වහාම විගණනයට ඉදිරිපත් කරමි. | -එම- |
| (ඇ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර දෙන ලෙස ඉල්ලා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. තනතුර අනුමත වූ වහාම අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය. දැනට බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් එම කාර්ය සිදු කරනු ලබයි. | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94(1)ට පටහැනිව පුනරාවර්තන වැය විෂයයන් 8 කට හා මූලධන වැය විෂයයන් 1 කට අදාල රු.3,983,308 ක ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා රු.5,044,625ක බැරකම් වලට එළඹ තිබුණි. | වැය විෂයන් 3 ක් අදාළ නොවන අතර වාහන අළුත්වැඩියාවන් අධික වීම, දෙසැම්බර් මසට අදාළ දුරකථන බිල්පත් 2022 ගෙවීම, අපේ ගම සඳහා වැය විෂයක් වෙන් නොකළ බැවින් ජන කලා කේන්ද්‍රයේ වැය විෂය යටතේ වියදම් දැරීමට සිදුවීම, කන්ද උඩරට සුරකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සඳහා වැය විෂයක් නොතිබුණ බැවින් මු.රෙ.66 මාරු කිරීම මගින් වියදම් දැරීම මේ සඳහා හේතු විය. | ගෙවිය යුතු සියළු අගයන් බැඳීම් හා බැරකම් ප්‍රකාශයට ඇතුලත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව වැය විෂයයන් 11කට අදාලව රු.4,419,964 ක ශේෂයක් දක්වා තිබුණද එකී බැරකම් වලට අමතරව නියැදි වවුචර් පරීක්ෂාවේදී 2022 ජනවාරි හා පෙබරවාරි මාසවල 2021 වර්ෂයට අදාලව අවස්ථා 27කදී රු. 12,374,686ක් ගෙවීම්කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල මුළු බැඳීම් හා බැරකම් රු. 12,374,686ක් අඩුවෙන් දක්වා තිබුණි. | ජාතික ප්‍රාසාංගික කලා මධ්‍යස්ථානයේ වියදම් පොදු තැන්පත් ගිණුම මගින් සිදු කරනු ලබන බැවින් එයට අදාළ වියදම් බැරකම් ලේඛනයට ඇතුළත් කර නොමැත. එම වියදම් ඉදිරියේ දී බැරකම් ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. අමාත්‍යාංශය, ආයතනවල පසුගිය වර්ෂයට අදාළ බිල්පත් 2022 වර්ෂයේ බැරකම් ලේඛනයට ඇතුළත් කර ඇත. | වර්ෂ අවසාන සියළු බැඳීම් හා බැරකම් ගිණුම් ගත කල යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) අනු ව්‍යවස්ථාව | නෙළුම් පොකුණ රගහල විසින් උපයන ආදායම් ඒකාබද්ධ අරමුදලට නොගෙවා ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පි ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අයත් අංක 009-0-020-0-0-6000 දරන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | එම ආයතනය වෙනුවෙන් වැය විෂයයක් ඇති කර එහි වියදම් දැරීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව අයවැය දෙපාර්තුමේන්තුව විසින් දුරකථන මඟින් දැනුම් දී ඇත. | උපයන සියලුම ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතුය. |
| (ආ) | 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතෙහි 18(1)(අ) හා 20(1) වගන්ති | නෙළුම් පොකුණ රගහල සඳහා ගමන්මළු පරීක්ෂණ යන්ත්‍රය මිලදී ගැනීමේදී අයනීකාර විකිරණ සම්බන්ධිත ක්‍රියා පිළිවෙතක් පැවැත්වීම පිළිබඳ සභාවට දැන්වීමට කටයුතු කර නොතිබුණි. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ අධ්‍යක්ෂක ජනරාල්ගේ අංක AERC/CS/11/G4/3 සහ 2021 අප්‍රේල් 09 දිනැති ලිපිය මඟින් දන්වා ඇති පරිදි යන්ත්‍රයෙහි මළු ගෙනයන පටියක අවම දිග (Conveyor belts) මීටර 1 ක් විය යුතු වුවද රඟහල විසින් මිලදීගත් | ඉහත යන්ත්‍රයෙහි මාන (Dimension) සහිත සටහනක් වේ. එසේ හෙයින් පරමාණුක බළශක්ති ආයතනයේ අනුකූලතාවයන් සපුරන බව නිරීක්ෂණය වේ.<br>ගමන්මළු යන්ත්‍රය තුලට ගෙනයන පටියෙහි දිග (conveyor belts) මීටර 1 ක දිගක් ඇති බව නිරීක්ෂණය වේ . | පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යන්ත්‍රය එම අවශ්‍යතාවය සපුරා නොතිබුණි. | | |
| (ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 3(1) | නෙළුම් පොකුණ රගහලට අදාල වියදම් වාර්ෂික ඇස්තමේන්තුවේ ඇතුලත් කර පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | වියදම්, සැලසුම් වාර්ෂික ඇස්තමේන්තුවේ ඇතුලත් කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 156 හා 210(2) | නෙළුම් පොකුණ රගහලෙහි මාසික විදුලි බිල්පත් නියමිත පරිදි නොගෙවීම හේතුවෙන් 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාලව රු.281,596 ක ප්‍රමාද පොලී සහ විසන්ධි කරන ලද විදුලි සැපයුම නැවත ලබා ගැනීම සඳහා රු.6,000ක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. | විදුලි බිල්පත් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් මුදල් ලබා ගැනීමට ප්‍රමාද වීම හේතුවෙන් බිල්පත් ගෙවීම ප්‍රමාද වී ඇත. | -එම- |
| (iii) මුදල් රෙගුලාසි 201(2) | 2021.10.15 දින සිට වැටුප් රහිත විදේශ අධ්‍යන නිවාඩු ලබාගෙන තිබූ නිලධාරිණියකට 2021 ඔක්තෝබර් හා නොවැම්බර් මාසයන්ට අදාලව වැටුප් ලෙස රු.94,747ක් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවූ වැටුප නැවත මුදලින් ගෙවන ලෙස දන්වා නිලධාරිනියට ලිපිය 2022.01.31 දින යවා ඇත. | -එම- |
| (iv) මුදල් රෙගුලාසි 261(1) | එකතුව රු.612,061ක් වූ ගෙවීම් වවුචර් 02 ක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සියලු වවුචර විගණනයට ඉදිරිපත් කරනු ඇත. | -එම- |
| (ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | | |
| මාර්ගෝපදේශ 8.12.4, 5.4.6 හා 5.4.8 | (a) මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානයේ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේදී කාර්ය නිමකිරීමට පෙර හා කාර්ය නිමකර ඇති බවට සහතිකයක් නොමැතිව 2021 | 2021 වර්ෂයේ ගිණුම් පියවීමේ චක්‍රලේඛ අනුව 2021.12.15 දිනට පෙර ITMIS පරිගණක පද්ධතියට සියලුම බැදීම් ඇතුළත් කරන ලෙස උපදෙස් ලැබී ඇති බැවින් 2021.12.14 දිනැතිව ඉදිරිපත් කළ Invoice | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දෙසැම්බර් 15 දින රු.2,000,000ක් වූ සම්පූර්ණ කොන්ත්‍රාත් මුදල ගෙවා තිබූ අතර විගණිත දිනය වූ 2022 මාර්තු 31 වන විටත් මහජනතාවට ප්‍රවේශ විය හැකි ආකාරයට වෙබ් අඩවිය ක්‍රියාකාරි තත්වයේ නොපැවතුණි. ගෙවීම් කිරීමේදී රඳවා ගැනීම් මුදලක් අඩු කරගෙන නොතිබූ අතර කාර්ය නිමකර වසර 1ක් දක්වා වූ කොන්ත්‍රාත්තුවේ නඩත්තු කාලය ආවරණය වන පරිදි ලබාගත යුතු කාර්යසාධන බැඳුම්කරය කාර්ය ආරම්භ කල දින සිට මාස 6ක් දක්වා පමණක් ලබා ගෙන තිබුණි. | පරිගණක පද්ධතියට ඇතුළත් කර ඇත. ඒ අනුව 2021.12.31 දින චෙක්පත් අංක 533274 යටතේ අදාළ ගෙවීම සිදුකොට ඇත.<br><br>නඩත්තු කාලය අවුරුද්දක් දක්වා දීර්ඝ කිරීමට කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ඉ) | 2017 අගෝස්තු 18 දිනැති අංක:අමප/17/1557/711/017 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය | 2021 දෙසැම්බර් 31 දින වන විටත් කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වූ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය විධිමත් පරිදි පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි. | ව්‍යවස්ථාපිත මණ්ඩලය සඳහා සකස් කල ලියවිල්ල සඳහා 2022.04.06 දින නීතිපතිවරයා විසින් නිරීක්ෂණ එවා ඇත. ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වූ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය විධිමත් පරිදි පිහිටුවීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 2.3 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| චීන තාක්ෂණික සහයෝගිතා ගිවිසුම අනුව, චීන සමාගමට රඟහලේ නඩත්තු කටයුතු සඳහා සඳහා අවශ්‍ය උපකරණ, යන්ත්‍ර හා උපාංග බදු නොගෙවා ආනයනය කර ගැනීමට ඉඩපහසුකම් සලසා තිබූ අතර 2021 ජනවාරි සිට ජූලි දක්වා කාලය තුල රඟහල වෙනුවෙන් චීන සමාගම ආනයනය කල භාණ්ඩ වෙනුවෙන් අමාත්‍යාංශය විසින් අවස්ථා 09 කදී රු.14,366,103 ක් රේගු බදු ගෙවා තිබුණි. ආනයනය කරන ලද භාණ්ඩ වල හිමිකම ශ්‍රී ලංකාවට පැවරී තිබූ අතර ගබඩාවෙහි ගබඩා කර තිබූ නඩත්තු කටයුතු සඳහා ආනයනය කරන ලද ප්‍රාග්ධන භාණ්ඩ වර්ග 19 ක අයිතම 74 ක් රඟහල වෙත භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. ගබඩාවෙහි පැවති භාණ්ඩ සමීක්ෂණය කර වාර්තා ඉදිරිපත් කරද නොතිබුණි. | 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය මේ වන විට අවසන් කර ඇති අතර චීන සමාගම විසින් ආනයනය කල ප්‍රාග්ධන භාණ්ඩ විධිමත්ව සොයා බලා රඟහල වෙත භාර දීමට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි සමාජිකයන් 3 ගෙන් යුතු මණ්ඩලයක් කර ඇත. | භාණ්ඩ විධිමත් පරිදි බාර ගැනීමට පියවර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 සැලැසුම් කිරීම**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සම්බන්ධයෙන් වූ 2017 අගෝස්තු 15 දිනැති අංක MSEW/CM/13/2017 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව කන්ද උඩරට උරුමය සුරැකීමට අදාලව ව්‍යාපෘති 4 ක් හඳුන්වා දී තිබුණද එම ව්‍යාපෘති 04 මත පදනම්ව එහි ක්‍රියාකාරකම් සැලසුම් කර නොතිබුණි. මණ්ඩලයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් රු.9,022,841ක ප්‍රතිපාදන වෙන් කල ව්‍යාපෘති 5 ක් වර්ෂය තුල ක්‍රියත්මක කර නොතිබුණි. | සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට මෙම ව්‍යාපෘති ඇතුලත් කලද රටේ පැවැති උග්‍ර ඩෙල්ටා කොවිඩ් තත්වය හේතුවෙන් මාස 02ට අධික කාලයක් රට වසා තැබීම හා අදාල මාර්ගෝපදේශ ලිහිල් වන කාලයක් පිලිබද නිශ්චිත අවබෝධයක් නොතිබුණ හෙයින් මෙම ව්‍යාපෘති කිරිම නවතා දමන ලදි. | කන්ද උඩරට උරුමය සුරැකීමට අදාලව ව්‍යාපෘති 4 අනුව ක්‍රියාකාරි සැලැස්ම පිලියෙල කර යුතු අතර වර්ෂය තුල ක්‍රියාකාරි සැලැස්මෙහි සඳහන් කාර්යයන් නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලැස්මේ අමාත්‍යාංශයට අදාල කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘති වල ස්වභාවය අනුව නිමැවුම් දර්ශකයම කාර්ය සාධන දර්ශකය වන බැවින් නිමැවුම් දර්ශකය පමණක් ඇතුලත් කර ඇත. | අමාත්‍යාංශය සඳහා කාර්යසාධන දර්ශක හඳුනාගත යුතුය. |
| (ඇ) | කලාකරු රක්ෂණ යෝජනා ක්‍රමය එක් ආයතනයක් යටතේ ක්‍රියාත්මක කලයුතු වූවද, නාට්‍ය කලාකරුවන් සඳහා වූ ප්‍රේක්ෂා කලාකරු රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ටවර්හෝල් රඟහල පදනම වෙත රු. මිලියන 15ක් ද, සියලු කලාකරුවන්ට හදිසි අනතුරු හා වෛද්‍යාධාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා අමාත්‍යාංශය වෙත රු. මිලියන 10ක් ද වූ ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණි. | ටවර්හෝල් රඟහල පදනම විසින් ක්‍රියාත්මක කරන ප්‍රේක්ෂා කලාකරු වෛද්‍යාධාර රක්ෂණය ටවර්හෝල් රඟහල පදනමෙහි ලියාපදිංචි නාට්‍ය ක්ෂේත්‍රයේ කලාකරුවන්ට පමණක් ලබා දේ. අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද කලාකරුවන් සඳහා වන හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණය ප්‍රාසංගික ක්ෂේත්‍රය, ලේඛන කලාව හා නාට්‍ය ක්ෂේත්‍රය ද ආවරණය වන පරිදි ලබා දෙන ලදි. රක්ෂණාවරණ දෙකෙහි අරමුණු හා ප්‍රතිලාභීන් ද වෙනස් වන අතර ද්විත්ත්වකරණයක් සිදු නොවේ. | අමාත්‍යාංශ/ ආයතන සිය අරමුණු හා කාර්යයන් පැහැදිලිව නිර්වචනය කරගෙන ඒ මත කටයුතු කලයුතු අතර ප්‍රතිපාදන ලබාගැනීමේදී ද්විත්ත්වකරණයවීම වැලැක්වීමට පියවර ගත යුතුය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කලාකරුවන්ගේ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම සහ කලාකරුවන් හා සේවාලාභීන් සම්බන්ධීකරණය කෙරෙන ඩිජිටල් යොමු නිර්මාණය කිරීම විගණිත දින වන විටත් පරිශීලකයන්ට භාවිතා කළ හැකි ආකාරයට නිර්මාණය කර නොතිබුණි. | අමාත්‍යාංශ වෙබ් අඩවිය තුළ කලාකරු දත්ත පද්ධතිය ක්‍රියාත්මක තත්වයේ පවතී. කලාකරුවන් සඳහා මාර්ගගත ක්‍රමයට (online) දත්ත පද්ධතියෙහි ලියාපදිංචි වීමට හා අවශ්‍ය අයෙකුට කලාකරු තොරතුරු දත්ත පද්ධතියට පිවිස ලබා ගැනීමට හැකිය. කලාකරු ඩිජිටල් යෙදුම් දෙකෙහි සියලු නිර්මාණ කටයුතු නිමවා තිබුනද එය App Store සහ Play Store සඳහා දැනට ස්ථාපනය කර නැත. එය භාවිතයට ගැනීම සඳහා යටිතල පහසුකම් රාශියක් සම්පූර්ණ කළ යුතු බැවින් ඒ සඳහා යම් කාලසීමාවක් වැයකිරීමට සිදුවේ. | සැලසුම් කල කාර්යයන් නියමිත පරිදි ඉටු කල යුතුය. |

## 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | නෙළුම් පොකුණ රඟහලට ගමන් මළු පරීක්ෂණ යන්ත්‍රයක් (Baggage Scanner) මිලදී ගැනීම සඳහාවූ ප්‍රසම්පාදනයේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කල පිරිවිතරයන් අනුව විකිණීමෙන් පසු සේවා කාලය වසර 10 ක් විය යුතු වුවද, සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබූ මිලගණන් වල වගකීම් කාල සීමාව වසර 05 ක් හා එය ඉක්මවූ පසු රු.3,196,520 ක් පිරිවැය වන සේවා ගිවිසුමක් ඇතිකර ගත යුතු විය. එසේ වුවද, එම පිරිවැය මිලගණන් ඇගයීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි. | වගකීම් කාලය අවසානයේ වගකීම් කාලසීමාව දික් කර ගැනීම සම්බන්ධයෙන් තීරණය කිරීම වගකීම් කාලය අවසන් වීමත් සමග රඟහල මඟින් සිදු කරනු ලබන බැව් පෙන්වා දෙමි. | ලංසු ඇගයීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානයේ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ කාර්යය සඳහා ලංසුකරුවන් 3ක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. තෝරාගන්නා ලද ලංසුකරු ලංසු ඉදිරිපත් කිරීමේදී කාර්යය සඳහා යොදවන කණ්ඩායම් සාමාජිකයන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබීම හා ආයතනයේ ලිපි ශීර්ෂයකින් හා බලය ලත් | ලංසු ඉදිරිපත් කළ ආයතන 2ක් කොන්ත්‍රාත්තුව නිම කිරීමට ගත වන කාලය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රතික්ෂේප වූ අතර තෝරාගත් ආයතනය එම සියළු අංග සහිතව ලංසුව ඉදිරිපත් කර තිබූ බවට තාක්ෂණික ඇගයුම් කමිටුව සෑහීමට පත්ව එම ආයතනය තෝරා ගැනීම සිදු කර ඇත. | -එම- |

නිලධාරියෙකුගේ අත්සනකින් ලංසුව ඉදිරිපත් කර නොතිබීම යන හේතු තාක්ෂණ ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් සැළකිල්ලට ගෙන නොතිබුණි.

### 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

--------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අමාත්‍යාංශයේ චෙක්පත් අත්සන් කරනු ලබන නිලධාරීන් වෙතින් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශය අලුතින් ඇති කරන ලද අමාත්‍යාංශයක් බැවින් ඇප තැබීම් කටයුතු මේ දක්වා සිදු කර නොමැති අතර එම කටයුතු සිදු කරමින් පවතී. | අදාල නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩල කාර්යාල පරිශ්‍රය සඳහා මහනුවර මහ නගර සභා සීමාව තුල පිහිටි වර්ග අඩි 6039ක ගොඩනැගිල්ලක් මාසිකව රු.1,000,000 ක බදු කුලියකට ලබා ගෙන තිබූ අතර එම බදු කුලී ගිවිසුම 2020 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් වුවද, ඒ වන විට නව ස්ථානයක් තෝරා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබීම හේතුවෙන් එම ගිවිසුම 2021 ජනවාරි 31 දක්වා මාස 3කින් දීර්ඝ කර තිබුණි. කාර්යාල පරිශ්‍රය සඳහා අවශ්‍ය බිම් ප්‍රමාණය වර්ග අඩි 3400 වුවද කලින් ගිවිසුම මාස 03 කට දීර්ඝ කිරීම හේතුවෙන් වර්ග අඩි 6039ක් සඳහා ගිවිසුම් ගත වීමට සිදුව තිබූ අතර ඒ සඳහා අතිරේකව ගෙවන ලද රු.18,000,000 ක වියදම අමාත්‍යාංශයට සිදුවූ පාඩුවක් විය. | 2020 වර්ෂයේ පැවති කොවිඩ් වසංගතය හමුවේ නිලධාරීන් සේවයට කැඳවා ගැනීමට තිබූ අපහසුතාවය හේතුවෙන් නියමිත දිනට ප්‍රසම්පාදන කටයුතු කිරීමට නොහැකි වී ඇත. එහෙත් කාර්යාල කටයුතු බාධාවකින් තොරව සිදු කර ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන තෙක් ගිවිසුම මාස 3කින් දීර්ඝ කර ඇත. | අතිරේකව ගෙවන ලද රු.18,000,000 ක මුදල ආවරණය කර ගැනීමට පියවර ගැනීම. |
| (ආ) | නෙළුම් පොකුණ රඟහල සඳහා ගමන්මළු පරීක්ෂණ යන්ත්‍රයක් මිලදී ගැනීමට අදාලව එක් ආයතනයක් ලංසු 02 ක් ඉදිරිපත් කර තිබූ අතර රු.2,999,000ක මිල පලමු ලංසුව ලෙසත්, රු.5,400,000ක මිල දෙවන ලංසුව ලෙසත් ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් දක්වා තිබුණද, තාක්ෂණික ඇගයීම් කමිටුව රු.5,400,000 ක මිල පලමු ලංසුව ලෙසත් රු.2,999,000 ක මිල දෙවන ලංසුව ලෙසත් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 5.3.17 අනුව විකල්ප මිල ගණන් ඉදිරිපත් කිරීම එම ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. | ලංසු ඇගයීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

සටහන් කර ලංසු ඇගයීමේදී දෙවන ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. මෙහිදී වෙනත් ආයතනයක් ඉදිරිපත් කර තිබූ රු.4,800,000ක මිල අවම මිල ලෙස පිළිගෙන යන්ත්‍රය එම සමාගමෙන් මිලදී ගැනීමට නිර්දේශ කර තිබීමෙන් අමාත්‍යාංශයට රු.1,801,000ක මූල්‍යමය පාඩුවක් සිදුව තිබුණි.

**3.6 අනාර්ථික ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නෙළුම් පොකුණ රඟහල තුල පෞද්ගලික සන්නිවේදන ආයතන තුනක් මඟින් පවත්වාගෙන යන සම්ප්‍රේෂණ ඇන්ටනා සඳහා සේවා සැපයීම වෙනුවෙන් බදුකුලී අයකිරීම සඳහා ගිවිසුම් වලට එළඹීමේදී 2015 වසරේ එකඟ වූ අගයන් සඳහාම 2020 වර්ෂයේදීත් බදු ගිවිසුම් වලට එළඹ තිබුණි. 2021 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව පෞද්ගලික සන්නිවේදන ආයතන තුන මඟින් නොගෙවන ලද බදුකුලී වටිනාකම රු.1,550,000 ක් සහ භාවිතා කල විදුලිය සඳහා අය විය යුතු මුදල රු.1,222,263 ක් වුුවද ගිවිසුම් වලට එළඹීමේදී ගෙවීම ප්‍රමාද වීම මත අයකල යුතු දඩ මුදලක් දක්වා නොතිබීමෙන් ප්‍රමාද දඩ අයකල නොහැකිව තිබුණි. | සන්නිවේදන ආයතනයන් රඟහල වෙත ගෙවිය යුතු බදු කුළිය හා විදුලි බිල මේ වන විට නිරවුල් කර ඇත.එම ගිවිසුම් වල ප්‍රමාද ගෙවීම් සඳහා වන දඩ මුදලක් පැණවීම පිලිබඳ කොන්දේසියක් ඇතුලත් කර ගැනීමට ඉදිරි කටයුතු සිදු කරනු ලබන බැව් දන්වා සිටිමි. | නව තක්සේරු අගයන් මත බදු ගිවිසුම් වලට ඇතුලත් වීමට හා සන්නිවේදන ආයතන බැඳීම් වලට යටත් වන පරිදි ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතු වේ. |

**3.7 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 ජනවාරි 09 දිනැති අංක SA/AMP/Deposit/Transfer දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව නෙළුම් පොකුණ රඟහල වෙනම ව්‍යාපෘතියක් ලෙස සලකා, එය නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන අයවැය මගින් සලසා ගැනීමටත් උපයන ලද ආදායම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා සුදුසු ආදායම් ශීර්ෂයකට බැර කිරීමටත් විගණිත දින දක්වා කටයුතු කර | 2020 වර්ෂයේ ප්‍රතිපාදන සඳහා සුදුසු වැය විෂයක් ලබා දී කටයුතු කරන ලෙස අය වැය දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂක ජනරාල් උපදෙස් ලබා දී තිබුණද එම කටයුතු තාවකාලිකව නැවතී ඇත. ඉදිරියේ දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට ඉදිරි කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වමි. | රඟහල වෙනම ව්‍යාපෘතියක් ලෙස සලකා, එය නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන අයවැය මගින් සලසා ගැනීමටත් උපයන ලද ආදායම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | නොතිබූ අතර අංක 6000-0-0-020-009-0 දරන තැන්පත් ගිණුම මගින් ගණුදෙනු මෙහෙයවා තිබුණි. | | විමසා සුදුසු ආදායම් ශීර්ෂයකට බැර කිරීමටත් පියවර ගත යුතුය. |
| (ආ) | නෙළුම් පොකුණ රඟහල කුලී පදනම මත ලබා දීමේදී අදාල කුලී ගැනුම්කාර පාර්ශව සමඟ ගිවිසුම්වලට එළඹ තිබුනද, රඟහල විධිමත් නෛතික පුද්ගලභාවයක් සහිත ආයතනයක් ලෙස ස්ථාපනය කිරීමට විගණිත දින දක්වා කටයුතු කර නොතිබීම හේතුවෙන් එම ගිවිසුමෙහි නෛතික වලංගුභාවයක් නොපැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව නෙළුම් පොකුණ රඟහල විධිමත් ආයතනයක් ලෙස ස්ථාපිත කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. | නෙළුම් පොකුණ රඟහල විධිමත් ලෙස ස්ථාපනය කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | නෙළුම් පොකුණ රඟහලේ විදුලි පරිභෝජන වියදම, රට තුල නිරෝධායන ඇඳිරිනීතිය පනවා තිබූ 2021 මැයි හා ජුනි මාසවල පිලිවෙලින් රු.1,448,590ක්, රු.1,261,714ක් හා ක්‍රියාකාරකම් කිසිවක් සිදුකර නොතිබූ 2021 සැප්තැම්බර් මාසයේ රු.1,519,859ක් වැනි ඉතා ඉහල අගයක් ගෙන තිබුණි. තවද මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් අය ක්‍රමය වූ General Purpose – 03 යටතේ kva-209152249 මනු කියවීම් වර්ගයෙන් ඒකකයට අයකරන මිල ඉතා ඉහල අගයක් ගෙන තිබුණද මෙම අයක්‍රමය වෙනස්කරගෙන විදුලි ගාස්තු අඩුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම කල සීමා තුල නිළදාරින්ට ඉන් පිටතට යාම නොදීම හේතුවෙන් එම නිලදාරීන් පැය 24 තුලම රැඳී සිටීම නිසා විදුලි බුබුළු, විදුලි පංකා ක්‍රියාත්මක කර ඇත. ඊට අමතරව නෙලුම් පොකුණ නඩත්තු කටයුතු සඳහා අත්සන් කර ඇති දෙවන අවබෝධතා ගිවිසුම අනුව එම කල සීමාව තුල Sound system, Lighting System, CCTV යනාදියේ ප්‍රතිස්ථාපනය චීන සමාගම විසින් මේ දින වල සිදු කර ඇත. ඒ බැවින් මේ කාලය තුලදී විදුලි බිල අඩු වී නොමැති බව කාරුණිකව දන්වමි. | විදුලි ගාස්තු අඩුකර ගැනීම කෙරෙහි අවධානය යොමු කර යුතුය. |
| (ඈ) | අපේ ගම පරිශ්‍රය පිහිටි අක්කර 13 රූඩ් 03 පර්චස් 25.1 කින් යුත් භූමියේ හිමිකම හා එහි ගොඩනැඟිලි යනාදිය නාගරික හා නිවාස අමාත්‍යාංශය යටතේ වන නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2021.12.14 දිනැති අංක AG/01/08 ලිපියෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිට පිටපත් සහිතව නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීමේ සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත අපේ ගම පරිශ්‍රයට අයත් ඉඩම පැවරීමට කටයුතු කරන ලෙස දන්වා යවා ඇත. | භූමියේ හිමිකම විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2020 නොවැම්බර් 20 දිනැති අංක 2202/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් අපේ ගම පරිශ්‍රය ( අපේ ගම කාර්යාල පරිශ්‍රය හැර) ජාතික උරුම, ප්‍රසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතට පවරා තිබුණ ද මධ්‍යම සංස්කෘතික | අංක 2202/05 හා 2020.11.20 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව අපේ ගම පරිශ්‍රය ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ විෂයය පථයට පවරා ඇති නමුත් අපේ ගම පරිශ්‍රය පවත්වාගෙන යාම වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් වී | අදාළ වියදම් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙතින් පියවා ගැනීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | අරමුදල විසින් පරිශ්‍රය අමාත්‍යාංශයට පවරා දී තිබුණේ 2021 අප්‍රේල් 01 දින සිටය. අදාල කාලය තුල අපේ ගම පරිශ්‍රයෙන් උපයන ලද අදායම රු.1,264,500 ක් මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් පරිහරණය කර තිබුණි. එම කාල සීමාවට අදාල සේවක වියදම්ද එම අරමුදල දැරිය යුතු වුවත් 2021 ජනවාරි සිට 2021 මාර්තු දක්වා කම්කරු දීමනා වශයෙන් රු.254,000 ක් රාජ්‍ය අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. | නොතිබුණි. ඒ සඳහා කාර්යමණ්ඩලය අනුයුක්ත කරද නොතිබීම නිසා එම කාලය තුළ මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් පරිපාලනය කිරීමට කටයුතු කර ඇත. එම මාස 04ක කාලය තුළ අපේ ගම පරිශ්‍රයේ කටයුතු වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල රු.8,516,760ක් වියදම් කර ඇත. කෙසේ වුවද 2021.04.01 දින සිට අපේ ගම රාජ්‍ය අමාත්‍යාංශය වෙත විධිමත් පරිදි පවරා ඇත. | |
| (ඊ) | 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 දරන ගැසට් පත්‍රය මගින් ග්‍රාමීය ජනකලා කේන්ද්‍රය රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා තිබුණද කේන්ද්‍රය නීත්‍යානුකූලව ස්ථාපිත කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන නොතිබුණි. | ජනකලා කේන්ද්‍රය 2020.08.09 වන දින වන විටත් පනතක් මඟින් විධිමත් පරිදි ස්ථාපිත කර ඇත. | ග්‍රාමීය ජනකලා කේන්ද්‍රය නීත්‍යානුකූලව ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |
| (උ) | 2021 අප්‍රේල් 11 දිනැති අංක CDD/MISC/CASE/127/2020 දරණ ලිපිය අනුව ශ්‍රී ලංකා රේගුව විසින් රාජ්‍ය අමාත්‍යාංශය වෙත මුදාහැරීමට නියමිතව පැවති රාජසන්තක කල වාහන දෙකක් අදාල ගාස්තු ගෙවා නිදහස් කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබීම හේතුවෙන් 2021 අප්‍රේල් 29 දින වන විටත් අදාළ වාහන වෙනුවෙන් රු.1,376,462ක ප්‍රමාද ගාස්තුවක් ගෙවන ලෙස දැනුම් දී තිබුණි. | රාජ්‍ය සන්තක කර ඇති මෙම රථ වාහන රේගුවෙන් මෙම අමාත්‍යාංශය වෙත මුදා හැරීම සිදු කර ඇතත් ඒ සඳහා ගෙවිය යුතු ගාස්තු ගෙවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. ඒ සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. අදාළ ප්‍රතිපාදන මේ දක්වා ලැබී නැත. | වාහන දෙක අදාල ගාස්තු ගෙවා නිදහස් කර ගැනීමට හා ප්‍රමාද ගාස්තු ආවරණය කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. |
| (ඌ) | කන්ද උඩරට උරුමය පිළිබඳ නිසි ව්‍යවස්ථාපිත මණ්ඩලයක් /අධිකාරියක් පිහිටුවන තුරු, කන්ද උඩරට උරුමයන් සුරැකීමට අදාළ විශේෂ දැනුම ඇති 10 දෙනෙකුගෙන් සමන්විත උපදේශක මණ්ඩලයක් පත් කර තිබූ අතර මෙම උපදේශන මණ්ඩලය 2020 සැප්තැම්බර් සිට 2021 දෙසැම්බර් දක්වා රැස්වී තිබුණේ එක් වරක් පමණි. | උපදේශක මණ්ඩල සාමාජිකයින් ලෙස මෙරට ගෞරවනීය පුරවැසියන්, කාර්යබහුල අමාත්‍යාංශ හා ආයතන ප්‍රධානීන් වන අතර පැවති වසංගත තත්වයේදී ඔවුන් කැඳවීමේදී විශාල අවධානමක් හා දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවීම සහ රජය මඟින් විටින් විට රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය උපදෙස් ලබාදීම නිසා තත්ත්වය සමනය වන තුරු උපදේශක මණ්ඩල රැස්වීම් පැවැත්වීම කල් දමන ලදී. | කන්ද උඩරට උරුමය පිළිබඳ ව්‍යවස්ථාපිත මණ්ඩලය /අධිකාරිය පිහිටුවිය යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණු අතර අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හා ඒ යටතේ වන ක්‍රියාකාරකම් තිරසාර සංවර්ධන අරමුණු ලෙස දක්වා තිබුණි. | කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන ඉලක්ක සටහන් කර ඇති අතර අමාත්‍යාංශය මගින් එම ඉලක්කය සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වල අරමුණු තිරසාර අරමුණු හා ගලපා සටහන් කර ඇත. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට කටයුතු කල යුතුය. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකිරීම සඳහා සැලසුම් සකස්කර හෝ අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ගෙන හෝ නොතිබුණි. | මෙම අමාත්‍යාංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත නොමැති බැවින් එම තනතුර අනුමත කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. තනතුර අනුමත වූ වහාම අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය. | අභ්‍යන්තර විගණනයක් සිදුකිරීම සඳහා පියවර ගත යුතුය. |

**6. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශය සඳහා ජ්‍යෙෂ්ඨ, තෘතීක, ද්වීතීක හා ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් පිළිවෙලින් 9, 3, 37 හා 13ක් බැගින් වන සේ 62 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය පිලිවෙලින් 7, 0, 50 හා 5ක් විය. ඒ අනුව ජ්‍යෙෂ්ඨ, තෘතීක හා ප්‍රාථමික මට්ටම් වලට අදාලව සේවකයන් 13 ක ඌණතාවයක් හා ද්වීතීක මට්ටමට අදාළව නිලධාරීන් 13ක අතිරික්තතාවයක් පැවතුනි. | අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයට අදාළ ද්විතීක මට්ටමේ අතිරික්ත නිලධාරීන් මෙම අමාත්‍යාංශයේ ඉල්ලීමකින් තොරව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් අනුයුක්ත කර ඇත. එම නිලධාරි අතිරික්තය පිළිබඳව අංක NH/AD/02/GT හා 2021.10.28 දිනැති ලිපිය මගින් එම අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | ජ්‍යෙෂ්ඨ, තෘතීක, ද්වීතීක හා ප්‍රාථමික මට්ටම් සඳහා අනුමත සේවක සංඛ්‍යාව පවත්වා ගත යුතුය. |